# තනි පුද්ගල සැපයුම්කරුවන් සඳහා වන අතිකාල තොරතුරු පත්‍රිකාව

වැඩ සතියේ සීමාවන් සහ අතිකාල පිළිබඳ නීති පිළිබඳ තනි පුද්ගල සැපයුම්කරුවන්හට අවබෝධයක් ලබා දීම මෙම තොරතුරු පත්‍රිකාවේ අරමුණ වේ. වැඩි විස්තර සඳහා කරුණාකර www.dshs.wa.gov/altsa/IPOT වෙත යන්න නැතහොත් සේවාදායකයාගේ සිද්ධි කළමනාකරු හා සම්බන්ධ වන්න.

සාමාන්‍ය අතිකාල තොරතුරු

1. වැඩ සතියක් යනු කුමක්ද?
   වැඩ සතියක් ඉරිදා මධ්‍යම රාත්‍රී 12.00 ට ආරම්භ වන අතර එය එළඹෙන සෙනසුරාදා රාත්‍රී 11:59 ට අවසන් වේ.

2. වැඩ සතියේ සීමාව (WWL) යනු කුමක්ද?
   WWL යනු ඔබ විසින් වැඩ සතියක් තුළ සේවය කරනු ලබන මුළු පැය ගණන වේ. 2016 වොෂිංටන් ප්‍රාන්ත නීතිය මඟින් තනි පුද්ගලයෙකුට (IP) වැඩ සතියක් තුළ වැඩ කළ හැකි මුළු පැය ගණන පිළිබඳ සීමාවක් පනවා තිබේ. සියලුම IPs හට හට සතියක (WWL) වැඩ සීමාවක් තිබේ. වැඩ පැය ගණනක් නියම කර ඇති විට ඔබ වෙත එක් සේවාදායකයෙකු හෝ සේවාදායකයන් කිහිප දෙනෙකු සහ ඔබ සේවය කරන සේවාදායකයා පැය ගණන ලබා ගැනීමට හිමිකම් ලබා ඇති විට ඔබ වැඩ කළ යුත්තේ WWL දක්වා පමණකි. සේවාදායකයින් විසින් ඔවුන්ගේ රැකවරණ සැලැස්මේ දක්වා ඇති තක්සේරු කරන ලද මාසික පැය ගණනට වඩා වැඩි පැය ගණනක් ඔබ වෙත ලබා නොදිය යුතුය. WWLs මඟින් අතිකාල වියදම් පාලනය කෙරෙන අතර එමඟින් සේවා සඳහා අවශ්‍ය අරමුදල් අවශ්‍ය සියලු දෙනාටම එම සේවා ලබා ගැනීමට අවශ්‍ය අරමුදල් ඉතිරි වේ.

3. DSHS විසින් මගේ ස්ථිර WWL තීරණය කරන්නේ කෙසේද සහ මගේ ස්ථිර WWL මා දැන ගන්නේ කෙසේද?
   ප්‍රාන්ත නීතිය සම්මත වූයේ 2016 අප්‍රේල් මාසයේදීය. 2016 ජනවාරි මාසය තුළදී පැය සාමාන්‍ය වශයෙන් 40කට වඩා වැඩි පැය ගණනක් සේවය කළ සේවකයන් හැර අනෙකුත් සියලු IPs න් සඳහා මෙම නීතිය මඟින් පැය 40 WWL පනවා තිබේ. පැය 40ට වඩා වැඩි WWLs තීරණය කරන ලද්දේ IP ගේ 2016 ජනවාරි මාසයේ ගෙවීම් කළ පැය ගණන 4.33 න් බෙදා ආසන්න පැය කාලට වැටයීමෙනි. 2016 මැයි මාසයේදී, DSHS විසින් IPs වෙත ඔවුන්ගේ WWL තොරතුරු ලිපි මඟින් දැනුම් දෙන ලදී. කිසිදු ස්ථිර WWL පැය 65 නොඉක්මවනු ඇත. ඔබ IP කෙනෙකු ලෙස වැඩ කිරීම ඇරඹුවේ 2016 ජනවාරි මාසයට පසුව නම්, ඔබේ WWL පැය 40 වේ.

4. මගේ ස්ථිර WWL වැරදි ලෙස තීරණය කර ඇතැයි මා සිතන්නේ නම් මා කළ යුත්තේ කුමක්ද?
   ඔබේ WWL වැරදි ලෙස තීරණය කර ඇති බව ඔබ සිතන්නේ නම්, ඔබට සේවාදායකගේ කළමනාකරු වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි අතර DSHS විසින් ඔබේ පැය ගණන වොෂිංටන් පරිපාලන සංග්‍රහය 388-144-0050 අනුව සමාලෝචනය කරනු ඇත.

5. **මගේ ස්ථිර WWL කිසියම් දවසක වෙනස් වේද?**
   ඔබේ ස්ථිර WWL පැය 60.25 සහ 60 අතර ගණනක් නම්, නීතියෙහි කිසියම් වෙනස් වීමක් සිදුවුවහොත් හැර, 2017 ජූලි මස 1 දින සිට එය පැය 60 දක්වා අඩු කෙරෙනු ඇත. එසේ නැතහොත් ඔබ IP කෙනෙකු ලෙස සුදුසුකම් ලබා සිටින තාක් කල් ඔබේ ස්ථිර WWL වෙනස් නොවනු ඇත. ඔබ සේවයෙන් විවේකයක් ලබා ගෙන අනාගතයේදී IP කෙනෙකු ලෙස නැවත සේවයට පැමිණියහොත්ද ඔබේ ස්ථිර WWL නොවෙනස්ව පවතිනු ඇත.

6. මගේ WWL ඇති සේවා පැය ගණනට කුමන සේවා අයත් වේද?
   - පුද්ගලික රැකවරණ සේවා
   - සහන රැකවරණ සේවා
   - කුසලතා අත්පත් කර ගැනීමේ පුහුණුව
   - තාවකාලික රැකවරණ සේවා

7. මගේ WWL ගමන් කරන වේලාවට, DSHS විසින් නියම කරනු ලබන පුහුණුවීම්වලට, හෝ වැටුප් ගෙවනු ලබන විවේක වේලාවන් (PTO) සඳහා අදාළ වේද?
   නැත. ඔබේ WWL තුළ ගමන් කරන වේලාවන්, DSHS විසින් නියම කරනු ලබන පුහුණුවීම්, සහ PTO අන්තර්ගත නොවේ. එයින් අදහස් වනුයේ සේවාදායකයාට අවශ්‍ය පරිදි ඔබගේ නියමිත පුහුණු වීම් ලබා ගත්, අනුමත ගමන් කරන වේලාවන් භාවිතා කළ, හෝ PTO ලබා ගත් සතිවල පවා ඔබට WWL දක්වා සේවය කිරීමට හැකි බවයි.

අතිකාල (OT) ගෙවීම්

8. මගේ OT ගණනය කරන්නේ කෙසේද?

ඔබ සතියක් තුළ සේවය කරනු ලබන පැය 40 ක කාලයක් සඳහා නිත්‍ය වැටුප් ගෙවනු ලැබේ. පැය 40ට වැඩියෙන් ඔබ වැඩ කරන පැය ගණන සඳහා, ඔබේ නිත්‍ය වැටුප මෙන් 1.5 ගුණයක වැටුපක් ගෙවනු ලැබේ.
IP ගේ එක් ගෙවීම් ක්‍රමයක් මඟින් ඔබ සතිය තුළ වැඩ කළ සම්පූර්ණ පැය ගණන සඳහා ඔබගේ නිත්‍ය වැටුප ගෙවනු ලැබේ (එය හඳුන්වනු ලබන්නේ "පූර්ණ වැටුප් ප්‍රමාණය") ලෙසය. එහි OT පෙන්වනු ලබන්නේ OT පැය ගණන සඳහා අතිරේක ½ ක වැටුප් ප්‍රමාණයක් ලෙසට වේ. ඒවායෙහි එකතුව ඔබගේ අවසන් වැටුපට එකතු කරනු ලැබේ.

නිදසුන*:*
ඔබ එක් සතියක පැය 45ක් වැඩ කළ අතර ඔබගේ නිත්‍ය වැටුප් ප්‍රමාණය පැයකට *$12* කි.
ඔබගේ වැටුප වනුයේ*:*
පැය *45 x* පැයකට *$12* (පූර්ණ වැටුප් ප්‍රමාණය*) = $540*
<u>+ අතිකාල පැය *5 x $6* (අර්ධ වැටුප් ප්‍රමාණය*) = $30*</u>
එකතුව *$540 +$30 = $570*

OT පෙන්නුම් කෙරෙනුයේ ගෙවීම් සාරාංශ විස්තරයේ වන අතර එය ඉපැයීම් කොටස තුළ සාරාංශගත කර තිබේ. මෙම නිදසුනේ ඉපැයීම් කොටස මඟින් පුද්ගල රැකවරණ පැය 45 සහ OT පැය 5 වේ.

9. ගමන් කරන වේලාව, DSHS විසින් නියම කරනු ලබන පුහුණුව සහ, වැටුප් සහිත විවේක කාලයන් (PTO) සඳහා මට OT ගෙවනු ලැබේද?

ඔබ සතිය තුළ වැඩ කරනු ලබන මුළු පැය ගණන පැය 40 ඉක්මවයි නම් ගමන් කරන වේලාව සහ DSHS විසින් නියම කරනු ලබන පුහුණුව සඳහා OT ගෙවනු ලැබේ. PTO වැඩ කළ පැය ගණනක් ලෙස නොසැලකේ, එබැවින් ඒවා OT ගෙවීම් සඳහා කිසිදු අවස්ථාවක ගණන් ගනු නොලැබේ.

ස්ථිර පැය 40 WWL හිමි IP සඳහා වැදගත් තොරතුරු

10. මට සතියකට පැය 40කට වඩා වැඩ කළ හැකිද?

තාවකාලිකව පැය 40කට වඩා වැඩ කිරීමට DSHS වෙතින් සේවාදායක නිශ්චිත අනුමැතියක් ලබා ඇත්නම් හැර ඔබ වැඩ සතියක් තුළ පැය 40කට වඩා වැඩ නොකළ යුතුය.

11. මම සේවාදායකයන් කිහිප දෙනෙකු වෙනුවෙන් සේවය කරන්නේ නම් මට මගේ ස්ථිර WWL ට වඩා වැඩ කළ හැකිද?

ඔබ සේවා දායකයන් කිහිප දෙනෙකු වෙනුවෙන් වැඩ කළත්, ඔබ විසින් ඔබගේ සියලු සේවාදායක වැඩ පැය ගණන ඔබේ ස්ථිර WWL තුළ කළමනාකරණය කර ගත යුතුය. ඔබ සේවාදායකයන් එක් අයෙකුට වඩා වැඩි ගණනක් වෙනුවෙනු වැඩ කරන්නේ නම්, ඔබේ සියලු වැඩ පැය ගණන එකට එකතු කළ විට ඔබේ ස්ථිර WWL ට වඩා වැඩි නොවන පරිදි, ඒ එකිනෙකා සඳහා වන ඔබේ වැඩ පැය ගණන කළමනාකරණය කර ගත යුතුය.

12. මගේ ස්ථිර WWL තුළ තිබෙන පැය ගණනට වඩා වැඩි පැය ගණනක් මාගේ සේවය ලබා ගැනීමට මා සේවය කරන මගේ සේවාදායකයාට අවශ්‍ය නම් මා කළ යුත්තේ කෙසේද?

- ඔබේ WWL ට වඩා වැඩ කිරීමට ඔබට අවසර නොමැති බවත් ඊට වඩා වැඩ කළහොත් අධි හිමිකම්පෑමකට ලක්විය හැකි බවත් ඔහුට පැහැදිලි කරන්න. අධි හිමිකම් පෑම් පිළිබඳ වැඩි විස්තර සඳහා #19 බලන්න.
- ඔබේ WWL ට වඩා වැඩිපුර වැඩ කිරීමට හේතු වන ආකාරයට වැඩ පැවරීම් භාර නොගන්න.
- අතිරේක සැපයුම්කරුවෙකු යොදවා ගැනීමට සේවාදායකයා දිරිමත් කරන්න.
- සේවාදායකයා අසීරු අවස්ථාවකට මුහුණ පා සිටී නම් ඔහුගේ/ඇයගේ සිද්ධි කළමනාකරු හා සම්බන්ධ වන ලෙස පවසන්න.
- හදිසි සහ ක්ෂණික අවශ්‍යතා සඳහා කරුණාකර 36 වන පිටුවේ #18 බලන්න.

පැය 40.25 කට වඩා වැඩි **WWL** සහිත **IP** සඳහා වැදගත් වන තොරතුරු

13. මට සතියකට පැය 40කට වඩා වැඩ කළ හැකිද?
ඔබේ ස්ථිර WWL පැය 40ට වඩා වැඩි බවට හෝ ඔබේ තාවකාලික සේවාදායක නිශ්චිත WWL වැඩිකිරීම අනුමත කර ඇති බවට ඔබට DSHS වෙතින් ලිඛිත දැනුම්දීමක් ලැබී ඇත්නම්, ඔබට එම නිවේදනයේ දැක්වෙන පැය ගණන දක්වා කාලයක් වැඩ කිරීමට ඔබටපුළුවන.

14. මා සේවාදායකයන් එක් අයෙකුට වඩා වැඩි ගණනක් සඳහා සේවය කරන්නේ නම් සිදු වන්නේ කුමක්ද?
කරුණාකර #11 ප්‍රශ්නයට දී ඇති පිළිතුර බලන්න.

15. මගේ ස්ථිර **WWL** ට වඩා වැඩ කිරීමට හැකි වන පරිදි මගේ පැය ගණන වෙනස් කිරීමට මගේ සේවාදායකයාට අවශ්‍ය නම් මා කළ යුත්තේ කුමක්ද?
පහත දැක්වෙන කරුණු සත්‍ය නම් ඔබට ඔබගේ පැය ගණන වෙනස් කර ගත හැකිය:
   - සේවාදායකයාට අවශ්‍යතාවයක් තිබීම; සහ
   - අමතර පැය ගණනක් සේවය කිරීමෙන් සේවාදායකයාගේ ඇස්තමේන්තු කළ පැය ගණන ඉක්මවා නොයයි නම්; සහ
   - එක් සතියක් තුළ වැඩිපුර කාලයක් වැඩ කිරීම සේවා දායකයාට එම මාසයේ අනෙක් සති තුළ අනිවාර්ය රැකවරණ කාලය නොලැබී යාමට හේතු නොවේ නම්; සහ
   - එක් සතියක් තුළ වැඩිපුර වැඩ කිරීම එම මාසය තුළ වන එක් එක් සතිය සඳහා ඔබේ WWL දක්වා වැඩ කළේ නම්, එම මාසය තුළ වන අතිකාල ප්‍රමාණයට වඩා වැඩිපුර අතිකාල සේවය කිරීමට ඔබට සිදු නොවේ නම්.

ඔබගේ WWL පැය 40ට වඩා වැඩි වන විට, ඔබ සාමාන්‍යයෙන් වැඩ කරන මාසයේ අතිකාල ප්‍රමාණය නොඉක්මවන තාක් ඔබට ඔබේ වැය පැය ගණන වෙනස් කිරීමට පුළුවන. මාසික අතිකාල පැය ගණන ගණනය කරනු ලබන්නේ ඔබේ WWL න් පැය 40ක් අඩු කර ඉතිරි ගණන එම මාසය තුළ තිබෙන සෙනසුරාදා දින ගණනෙන් වැඩි කිරීම මඟිනි.

<u>නිදසුන:</u>
ජෝසිගේ *WWL* පැය *46* කි. ජෝස්ට වැඩ කළ හැකි මාසික අතිකාල ප්‍රමාණය තීරණය වනුයේ ඔහුවැඩ කරන මාසය තුළ ඇති සෙනසුරාදා දින සංඛ්‍යාවෙනි.
සෙනසුරාදා දින 5 ගණනය කිරීම*: 46 – 40 = 6 x 5 = 30*
සෙනසුරාදා දින 4 ගණනය කිරීම*: 46-40=6 x 4 = 24*
ජෝස් සේවය කරන සේවාදායකයාට මාසය පුරා නම්‍යශීලී කාලසටහනකට අනුව සේවය ලබා ගැනීමට අවශ්‍යය.

ඔබ සේවය කරන ඔබගේ සේවාදායකයා ඔවුන්ගේ New Freedom හෝ Veteran Directed Homecare Services මුදල් වෙන්කිරීම් වෙතින් අමතර අතිකාල වේලාවන් මිලට ගන්නේ නම්ද ඔබගේ WWL ට වඩා වැඩ කිරීමට ඔබගේ පැය ගණනන් වෙනස් කර ගැනීමට ඔබට පුළුවන.

16. මාගේ **WWL** හි පැය ගණනට වඩා වැඩි මාසික අතිකාල පැය ගණනක් සේවය කිරීමට හැකි වන පරිදි කාලසටහන් සකස් කිරීමට මගේ සේවාදායකයාට අවශ්‍ය නම් කළ යුත්තේ කුමක්ද?
කරුණාකර #12 ප්‍රශ්නයට දී ඇති පිළිතුර බලන්න.

තාවකාලික සේවාදායක නිශ්චිත වැඩ සති සීමාව (**CSWWL**)

17. තාවකාලික **CSWWL** යනු කුමක්ද?
ඔබ සේවය කරන ඔබගේ සේවාදායකයා තම අවශ්‍යතා සපුරා ගැනීමට අමතර සේවා සපයන්නන් සොයන අතරතුර ඔහුට හෝ ඇයට තාවකාලිකව ඔබගේ WWL ඉහළ නංවා ගැනීමට DSHS වෙතින් ඉල්ලීමක් කළ හැකිය. ඒ සඳහා වන අනුමැතිය හෝ ප්‍රතික්ෂේප කිරීම දන්වමින් DSHS වෙතින් ඔබ වෙත ලිඛිත ලිපියක් ලැබෙනු ඇත. අනුමත වුවහොත්, එම අනුමැතිය ආරම්භ සහ අවසන් වන දවසත් අනුමත වී ඇති පැය ගණනත් එම නිවේදනය මඟින් ඔබ වෙත දැනුම් දෙනු ඇත. ඔබ සේවය කරන සේවාලාභියා වෙතද එහි පිටපතක් යැවෙනු ඇත. මෙම ඉල්ලීම/ලිඛිත නිවේදනය CSWWL ඉල්ලීම ලෙසද හැඳින්වේ. සේවාදායකයාගේ ඇස්තමේන්තු කළ මාසික පැය ගණන ඉක්මවන තාවකාලිකව WWL ඉහළ දැමීමේ ඉල්ලීම් අනුමත නොකරනු ඇත.

හදිසි අවශ්‍යතා

18. මා මගේ WWL තුළ වන සියලු පැය ගණන අවසන් කර ඇති නමුත් මගේ සේවාදායකයාට හදිසි හා අත්‍යවශ්‍ය අවශ්‍යතාවයක් ඇති වී මට ඔහුගෙ සෞඛ්‍යය හා ආරක්ෂාව වෙනුවෙන් අඛණ්ඩව වැඩ කිරීමට සිදු වුවහොත් කළ යුත්තේ කුමක්ද?
    - තත්වය ආරක්ෂිත හා ස්ථාවර වන තෙක් සේවාදායකයා සමඟ රැඳී සිටින්න.
    - හදිසි වෛද්‍ය සේවා අවශ්‍ය වන හදිසි තත්වයක් නම්, 9-1-1 අමතන්න.
    - තත්වය ආරක්ෂිත වූ වහාම ඔබගේ වැඩ දිනය අවසන් කරන්න.
    - තත්වය පැහැදිලි කිරීමට ඊළඟ වැඩ කරන දිනයේදී ඔබගේ සිද්ධි කළමනාකරු අමතන්න.

අධි හිමිකම්පෑම්

19. හිමිකම්පෑමක් යනු කුමක්ද?
    පහත අවස්ථාවන්හිදී අධි හිමිකම්පෑම් ඇති වේ:
    - ඔබට සේවා සැපයීමට හිමිකම් ඇති පැය ගණනට වඩා වැඩි පැය ගණනක් සේවය කිරීම; හෝ
    - ඔබගේ WWL ට ඉහළින් වන ඔබගේ වැඩ පැය ගණන DSHS විසින් අනුමත නොකිරීම; හෝ
    - ඔබ විසින් සතියක කාලයක් තුළදී ලබා දීමට හිමිකම් ඇති වේලාවට වඩා වැඩි ගමන් කාලයක් සඳහා හිමිකම් පෑම

20. කොන්ත්‍රාත්තු ක්‍රියාමාර්ගයක් යනු කුමක්ද?
    කොන්ත්‍රාත්තු ක්‍රියාමාර්ගය නම් DSHS වෙතින් ඔබ වෙත නිවේදනයක් එවීමය. එම නිවේදනයෙන් සඳහන් වනුයේ ඔබ අනුමත කර ඇති ප්‍රමාණයට වඩා අතිකාල සේවා පැය ගණනක් වැඩ කර ඇති බව හෝ ඊට වඩා වැඩි ගමන් කාලයක් සඳහා හිමිකම් පා ඇති බවය.

21. මගේ WWL හෝ ගමන් කාල සීමාවට වඩා වැඩි කාලයක් මා සේවය කළහොත් කුමක් වේද?
    - ඔබ ඔබගේ හිමිකම් ඉක්මවා යන සෑම අවස්ථාවකම DSHS වෙතින් ඔබ වෙත අනුමත නොකළ අතිකාල සේවය කිරීමේ වැදගත්කම සිහිපත් කරමින් ලිඛිත කොන්ත්‍රාත්තු ක්‍රියාමාර්ග නිවේදනයක් සහ තොරතුරු එවනු ඇත. ඔබ සේවය කරන සේවාදායකයා(යන්) සහ ඔවුන්ගේ නියෝජිතයින් වෙතද එම නිවේදනය යැවෙනු ඇත.
    - හිමිකම් ඉක්මවා යන තුන් වන අවස්ථාවේදී, ඔබගේ කොන්ත්‍රාත්තුව අවසන් කිරීම හෝ දින 90ක් යන තුරු ගෙවීම ලබා ගැනීමට ඔබට නොහැකි වීම හෝ සිදු වනු ඇත. ඔබගේ කොන්ත්‍රාත්තුව අවසන් කළහොත් නව කොන්ත්‍රාත්තුවක් ලබා ගැනීමට දින 90ක් ගත වන තෙක් සිටීමට ඔබට සිදු වනු ඇත.
    - ඔබ සැලකිය යුතු ලෙස ඔබගේ වැඩ සති හෝ ගමන් කාල සීමා ඉක්මවා යන්නේ නම්, කඩ කිරීම් හා අදාළව DSHS විසින් ඔබගේ කොන්ත්‍රාත්තුව අවසන් කරනු ඇති අතර ඔබ වෙත නව කොන්ත්‍රාත්තුවක් ලබා දීම ප්‍රතික්ෂේප කරනු ඇත.

22. මගේ ගොනුව තුළ කොන්ත්‍රාත්තු ක්‍රියාමාර්ග තැබෙනු ඇතිද?
    කොන්ත්‍රාත්තු ක්‍රියාමාර්ග නිවේදනයේ දින සිට මාස 12ක කාලයක් සඳහා එක් එක් කොන්ත්‍රාත්තු ගිවිසුම විවෘතව තබා ගැනෙනු ඇත. මාස 12කට පසුව, කොන්ත්‍රාත්තු ක්‍රියාමාර්ගය අවසන් කෙරෙනු ඇත.

23. මට කොන්ත්‍රාත්තු ක්‍රියාමාර්ගය අවසන් කළ හැක්කේ කෙසේද?
    - හැමවිටම ඔබගේ වැඩ කාලසටහන් කලින් සැලසුම් කර ගත යුතු අතර එය ලියා ගත යුතුය.
    - සේවාදායකයාගේ අවශ්‍යතා වෙනස් වී ඔබගේ WWL ට බලපාන ආකාරයට ඔබට වෙනස් වැඩ කාලසටහනකට වැඩ කිරීමට සිදු වේ නම්, වහාම සිද්ධි කළමනාකරු අමතන්න.
    - ඔබ වැඩ කරන එක් එක් දිනයට පසුව, ඔබගේ වැඩ වේලාවන් ඔබගේ වේලා පත්‍රයෙහි සටහන් කරන්න, එය කඩදාසි දිනදර්ශනයක සටහන් කිරීම උපකාරී වනු ඇත.
    - ඔබගේ WWL ඉක්මවා නොයන ආකාරයට කටයුතු කිරීම පිළිබඳව ඔබට සහ ඔබගේ සේවායෝජකයාට/සේවාදායකයාට උපකාරී විය හැකි වැඩිදුර සම්පත් DSHS සතුව තිබේ. මෙම සම්පත් www.dshs.wa.gov/altsa/IPOT යන වෙබ් අඩවියෙන් ලබා ගැනීමට පුළුවන.